රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 07/2020(I)

මගේ අංකය : EST-06/04/LOANS/4072
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2020.03.29

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**නව කොරෝනා වෛසරය හේතුකොට ගෙන, උද්ගතව ඇති තත්ත්වය සැලකිල්ලට ගෙන රජයේ නිලධරයන්ට සහන සැලසීම**

ඉහත මැයෙන් 2020.03.26 දිනැතිව නිකුත් කළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2020හි 02 වගන්තිය, ජනාධිපති විධානයකට අනුව පිහිටුවා ඇති නව කොරෝනා වෛරස් තත්ත්වය ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීමේ කාලය තුළ ජන ජීවිතය යථා පරිදි පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන්නා වූ භාණ්ඩ, සේවා හා අනෙකුත් පහසුකම් අඛණ්ඩව සැපයීම මෙහෙයවීම, අධීක්ෂණය සහ පසුවිපරම පිණිස පත්කර ඇති ජනාධිපති කාර්ය සාධක බලකායේ උපදෙස් අනුව පහත පරිදි සංශෝධනය කෙරේ.

> **"02. 2020 අප්‍රේල් මස වැටුප, අප්‍රේල් මස 08 දින ගෙවීමට කටයුතු කරන අතර, පවත්නා සුවිශේෂී තත්ත්වය සැලකිල්ලට ගෙන සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද සඳහා වන උත්සව අත්තිකාරම් අනියම් හෝ ආදේශක පදනම මත සේවය කරන අයට පමණක් ගෙවීමට කටයුතු කරනු ඇත."**

02. තවද, නව කොරෝනා වෛරසය ව්‍යාප්ත වීම පාලනය කිරීම සඳහා රජයේ නිලධරයන්ට විශේෂ නිවාඩු ලබාදීම ආරම්භ වූ දිනය වන විටත් අනියම් හෝ ආදේශක පදනමින් රජයේ ආයතනවල සේවයේ නිරතව සිටි අයට එම විශේෂ නිවාඩුව ආරම්භ කළ දිනෙන් පසු සේවයට වාර්තා නොකළ ද මෙම වසරේ අප්‍රේල් සහ මැයි මාස සඳහා ස්ථිර රජයේ නිලධරයන්ට වැටුප් ගෙවීමට නියමිත දිනයන් තෙක් විශේෂ නිවාඩු ලබා දී ඇති දින වෙනුවෙන් ඔවුන් සේවයට වාර්තා කළා සේ සලකා අදාළ පරිදි දෛනික වැටුප් ගෙවීමට සියලුම ආයතන ප්‍රධානීන් ක්‍රියා කළ යුතු ය.

03. මෙම චක්‍රලේඛය ජනාධිපති කාර්යාලයේ උපදෙස් අනුව හා මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව නිකුත් කෙරේ.

එස්. හෙට්ටිආරච්චි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය